# ජනාධිපතිතුමාට තව අභියෝගයක්

**අනෙක් අතට එදා කුමරතුඟුවන් මුහුණ දුන් තත්වයට වඩා අද සිංහල භාෂාව අසරණව අහේනියට පත්ව ඇත්තේ ය. මේ වූ කලි වැටත්, නියරත් දෙකම ගොයම් කන කාලයකි. ඒ හානිය ගැන කුඹුරු හිමියාට පැමිණිලි කිරීමෙන් පලක් නැත. වැටත්, නියරත් දෙකම හීලෑ කරගත යුත්තේ මඩට බසින ගොවියා ය. අද සිද්ද වෙලා තියෙන ඇබැද්දිය හරියටම ඉංග්‍රීසියෙන් කියන විදියට නම් “සුක්කානම අල්ලා ගත් රියදුරා නින්දට වැටුණා වාගේ” බිහිසුණු වූවකි.......**







## කස්තිරම

**ඩී බී කුරුප්පු**

“ඉතා භයානක ලෙස භාෂාව විනාශ වේගෙන යන අන්දම ගැන කම්පනයට පත් භාෂාප්‍රේමී විද්වත් කීපදෙනෙක් බස බේරා ගැනීමට ඉදිරිපත් වන ලෙස ජනාධිපති මහින්ද රාජපක්ෂ මහතාගෙන් ඉල්ලා සිටින වැඩ පිළිවෙලක් සකස් කර ගෙන යති. ”

මේ 2009 ජුලි 13 වන දින දිනමිණ පත්තරයේ ආ පුවතක මුල් වැකියයි. ජනාධිපතිතුමා තිස් වසරක් පුරා ශ්‍රී ලංකාවට උවදුරක්ව පැවැති ත්‍රස්තවාදයෙන් රටත් ජනතාවත් බේරා ගත්තා පමණි. එතුමා ඊටත් වඩා බරපතල රාජකාරියකට මේ වන විටත් අත ගසා ඇත. ඒ බේද බින්නව ගිය ජනතාවක් සමගි සම්පන්න කොට එකමුතු ජාතියක් බවට පත් කිරීමය. එසේ කරනු වස් ත්‍රස්ත යුද්ධයේදී අවතැන් වූ ලක්ෂ සංඛ්‍යාත ජනතාව ඔවුන්ගේ නිවෙස් වල පදිංචි කරවා සුඛිත මුදිත කරලීම ද අවශ්‍ය ය.

අර කියන විද්වතුන් ජනාධිපතිතුමා ඉදිරියේ ඇති මෙමෙ අභියෝගය නොදන්නවා විය නොහැකිය. සමහර විට ලොව මවිත කරමින් කොටි ත්‍රස්තවාදීන් පරදවා ලූ ඔහුට, කළ නොහැකි දෙයක් නැත යන විශ්වාසය මෙම විද්වතුන් තුළත් ජනිත වූවාද යන්න කිව නොහැක. අනෙක් අතට මේ රාජකාරියත් එතුමාට බාර දෙන්නට හිතනවා කියන්නේ, තමන්ට අත ගහන්නට බැරි බරක් බව තේරුම් ගෙන ඇති බවකි.

ප්‍රවෘත්තියේ අනෙක් කොටස කියවන්නටත් පෙර මගේ සිත ඇදී ගියේ අතීත සිද්ධියක් වෙත ය. එය නම් මේ වාගේ ඉල්ලීමක් නොවේ. අභියෝගයක් හෝ සමච්චලයක් ලෙසින් ද ගත හැකිය. එම චෝදනාව ඉදිරිපත් කළේ එවක සිටි අතිප්‍රබල සිංහල වියතා වූ කුමාරතුංග මුනිදාස ය. එය තමාගේ බැරිකම නිසා කරන ලද කන්නලව්වක් නොව, සරසවි සිසුවන්ගෙ සිංහල ගැන එහි අධිපතියාට කරන ලද තරවටුවකැයි කියන්නටත් පුළුවන. ප්‍රස්තුත කාරණය වූයේ රඹුක්වැල්ලේ සිද්ධාර්ථ හිමියන් ගැන පසුව මාගේ ගුරුවරයකු වූ සිරි අයියා හෙවත් යූ.එස්.පෙරේරා නම් වූ සරසවි සිසුවකු විසින් රචනා කරන ලද ශෝක ප්‍රකාශයේ එන වැරදිය. එහි වියරණ දොස් ලෙසින් ගත හැකි නිදසුන් දෙකක් විය.

“කපුටො කොටයි” සහ “සිසු කැල සොහොනෙ හැපේ”, යන දෙතැන ය. එක අතකින් කපුටො කොටයි යන්න කට වහරේ එන විදිහ යැයි කියා ඇඟ බේරා ගන්නට ඉඩ තිබුණකි. අනෙක් වරද නම් එහෙම නිදහසට කරුණක් පෙන්වා ගැලවෙන්නට ඉඩක් නොවීය. එහෙත් මේ ලියුවේ සරසවියේ උගන්නා තරුණයකු බව සලකන විට ඒ බරපතළකමත් අඩු වන්නේ ය. එහෙත් එදා සිටි මහා පඬුවා එබන්දක්වත් නොයිවසන වියතකු වූ නිසා ඔහු සිය ලිපිය ඉදිරිපත් කළේ “හෙළ සරසවියේ පෙරටු අයිවර ජැනිංසු දකුටුරුවන්ට” ය. අපේ ම බසින් කියතොත් සරසවි උපකුලපති ආචාර්ය අයිවර් ජෙනිංග්ස්ට ය.

සිංහල නොදන්නා සුදු මිනිහකුට අරහෙම චෝදනාවක් කිරීම එක අතකින් විහිළුවක් යයි කිව හැක. කෙසේ වුවත් 1941 අප්‍රේල් 02 වන දින “සුබසෙහි” පළ වූ එම අභියෝගය මේ කරන්නට යනවා යයි කියන ඉල්ලීමට සම කළ නොහැකිය.

අනෙක් අතට මේ ඉල්ලා සිටින්නේ සිංහල නොදන්නා කෙනෙකුගෙන් නොවේ. මහින්ද රාජපක්ෂ ජනාධිපතිතුමා සිංහල නො දන්නවා යයි කීම රුහුණට පමණක් නොව මුළු රටටම කරන අපහාසයක් වනු ඇත. එහෙත් මේ වියතුන් දැන දැනම අමතක කරන කරුණක් ඇත.

මේ වියතුන් බස හදාරා එහි විශේෂඥයන් බවට පත් වෙද්දී ළපටි වියේම දේශපාලනයට පිවිසි ජනාධිපති තුමාගේ අවධානය සම්පූර්ණයෙන්ම යොමු වූයේ දේශපාලකයකු ලෙසින් තමාට ඉටු කළ හැකි කොටස කෙරෙහි ය. මෑතක එතුමා අත්පත් කර ගත් ජයග්‍රහණය එම කාර්යභාරය කූටප්‍රාප්ත වූවකැයි ද කිව හැකි වුවත් එතුමා ඉදිරියේ තවත් දේශපාලන අභියෝග ගණනාවක්ම ඇති බව ද අවධාරණය කළ යුතු ය.

අනෙක් අතට එදා කුමරතුඟුවන් මුහුණ දුන් තත්වයට වඩා අද සිංහල භාෂාව අසරණව අහේනියට පත්ව ඇත්තේ ය. මේ වූ කලි වැටත්, නියරත් දෙකම ගොයම් කන කාලයකි. ඒ හානිය ගැන කුඹුරු හිමියාට පැමිණිලි කිරීමෙන් පලක් නැත. වැටත්, නියරත් දෙකම හීලෑ කරගත යුත්තේ මඩට බසින ගොවියා ය. අද සිද්ද වෙලා තියෙන ඇබැද්දිය හරියටම ඉංග්‍රීසියෙන් කියන විදියට නම් “සුක්කානම අල්ලා ගත් රියදුරා නින්දට වැටුණා වාගේ” බිහිසුණු වූවකි. රිය පැදවීම බාර ගත්තාට පාර බලන්නටවත්, පාරේ යන එන මිනිසුන් නොමරා ඉදිරියට යන්නටත් සිහිකල්පනාවක් නින්දට ගිය විට නැත.

මේ කියන කියමන දරුණු වැඩි යැයි කියන්නන්ට මම නිදසුනක් දෙකක් පෙන්වන්නම්. ඒ නිදසුන් සහිත ලිපි දෙකක් පහනට ලියූවෙමි. එකක මා පෙන්වා දුන්නේ “එපුර රැජයූ ඇය” නමින් නව කතාවක් ලියන කැළණිය සරසවියේ මහාචාර්ය චන්ද්‍රසිරි පල්ලියගුරුගේ සිංහල ගැන ය. වියරණ වරද්දන තැන් ය. අනෙක් ලිපියෙන් කොළඹ සරසවියේ සිංහල මහාචාර්ය ධූරය දරා විශ්‍රාම ගිය කුසුමා කරුණාරත්නගෙ සිංහල ගැන ය. ඇය ම ලියූවක් නොවේ “මට තාම මතකයි” යනුවෙන් ඇගේ සැමියා වන මහාචාර්ය කරුණාරත්න ලියූ පොතේ සිංහල නිවැරදි කළේ ඇය බව කතුවරයාම කියා ඇත. වගකීම ඇයට පැවරෙන්නේ ඒ නිසාය.

කලින් මා වැටත්, නියරත් ගොයම් කන බව කීවේ මේ නිදසුන් ද සිහිපත් කර ගෙනය. ළමයින් කන රටේ කුකුලන් ඇති කරන්නට යාම විහිලුවක් බව ජනාධිපතිතුමාට පැමිණිලි කරන්නට අර අඳින විද්වත් පිරිස නොදන්නවා විය නොහැකි ය.

අනෙක් අතට මේ භාෂා පරිහානිය අද ඊයේ පටන් ගත්තක් ද නොවේ. “නිවැරදි සිංහල ලිවීමේ සංස්කෘතියක් අපට නැතැයි” මහාචාර්ය ඒ.වී.සුරවීර ප්‍රකාශ කොට දැන් දැවුරුද්දක් පමණ වෙතැයි සිතමි. නිවැරදි සිංහල ලියන්නට දත් ඔහු හෝ අනෙක් උගතකු මේ තත්ත්වය වෙනස් කිරීමට ප්‍රයත්නයක් දැරූ බවක් මා අසා නැත.

“දිනමිණ පුවතේ එම වියතුන් එක්ව පවත්වන සාකච්ඡාවක් ගැන ද කියැවේ. ඒ සාකච්ඡාවේ කැඳවුම්කරුවන් වනුයේ පණ්ඩිත සිරි තිලකසිරි සහ ඩී.එෆ්.කාරියකරවන ය. මගේ ඇයි හොඳයියක් නැතත් මා දන්නා පුද්ගලයකු වන කාරියකරවන මේ උවදුර ගැන දිගින් දිගටම උද්ඝෝෂණය කළ බව දනිමි. මට තවත් නිදසුනක් මතකය. අර සාකච්ඡාවට ඇරයුම් ලැබූවන් අතර සිටින කරුණාරත්න අමරසිංහ වසර හතරකට පමණ උඩ දී මේ රටේ එස්.බී.එස් සිංහල ගුවන්විදුලියේ ප්‍රධානියාව සිටි ආචාර්ය වික්‍රම සමඟ පැවැත් වූ සාකච්ඡාවක්. එහිදී අමරසිංහ කීවේ මේ වාගේ බරපතළ සුද්ද කිරීමේ කාරියක් සඳහා පත් කරන ලද කමිටුවක් ගැනය. එම කමිටුවට මහාචාර්ය විමල් බලගල්ලේ, මහාචාර්ය ජේ.බී.දිසානායක සහ මහාචාර්ය සුනන්ද මහේන්ද්‍ර ඇතුළු පිරිසක් ඇතුළත් බවද ඔහු සඳහන් කළේය. ඒත් ඒ කමිටුව කළ දෙයක් හෝ කමිටුවට සිදු වූ දෙයක් හෝ මට නම් දැනගන්නට ලැබුණේ නැත. කොහොමවත් ඔවුන්ගෙන් පලක් නොවූ බවට වත්මන් පිරිහීම සාක්ෂි දරන්නේ ය. දැනට වසර තුනකට පමණ පෙර, 2006.12.31 වන දින තිලකරත්න කුරුවිට බණ්ඩාරගේ “මව්බිම” පත්තරයට මා ලියූ ලිපියක් මට මතක් වෙයි. “ලබ ධාතුවේ බල මහිමය” යනුවෙන් මා ලියූ ඒ ලිපියෙන් අවධාරණය කළේ මෙලෝ විචාරයක් නැතිව ලේඛකයන් පමණක් නොව කථිකයන් පවා යොදන්නට පටන් ගත් කර්මකාරකය ගැන ය. එය විකාරයක් බවට පත්ව ඇති සැටි ය. දැන් ඒ විකාරය ව්‍යාධියක් බවට පත් වී ඇති සැටියෙන්ම අපේ වියතුන්ට “සුක්කානම අල්ලා ගෙන සිටියදීම නින්ද ගිහිල්ලා” ඇති බව පැහැදිලි වන්නේ ය.

මෑතදී මේ පිළිබඳව මා දුටු හොඳම (නරකම) නිදසුන ඉදිරිපත් වූයේ ප්‍රකට ලේඛකයකු වන නිව්ටන් ගුණසේකරගෙනි. පුවත්පතකට ලියූ ලිපියක එක් වැකියක් ඔහු පටන් ගන්නේ “මෙම ලිපිය ලියනු ලබන මම..” යනුවෙනි. වැකියේ ඉතිරි හරිය නිවැරදිය. එහෙත් මේ ටික ගැන නම් ඔහුට සමාවක් දිය නොහැකි ය.

මේ වැටී ඇති අගාධයෙන් භාෂාව ගොඩ ගැනීම දේශපාලඥයන්ට පවරන්නට බැරිය. මෙය මහා පරාක්‍රමබාහු රජතුමා දුසිල් මහණුන් පලවා හැර සඟ සසුන සුද්ද කළා වාගේ රජකුට

26 වන පිටුවට

